# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 1982 අංක 10 දරන
# ත්‍රස්තවාදය වැළැක්වීමේ (තාවකාලික විධිවිධාන) (සංශෝධන) පනත

---

[සහතිකය සටහන් කළේ 1982 මාර්තු මස 15 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1982 මාර්තු මස 19 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ IIවන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

---

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළ දී ලබාගත හැක

මිළ : ශත 45 යි. තැපැල් ගාස්තුව : ශත 50 යි.

# 1982 අංක 10 දරන ත්‍රස්තවාදය වැළැක්වීමේ (තාවකාලික විධිවිධාන) (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1982 මාර්තු මස 15 වන දින]

එල්. ඩී.—ඕ. 68/81

**1979 අංක 48 දරන ත්‍රස්තවාදය වැළැක්වීමේ (තාවකාලික විධිවිධාන) පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

1. මේ පනත 1982 අංක 10 දරන ත්‍රස්තවාදය වැළැක්වීමේ (තාවකාලික විධිවිධාන) (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. — ලුහුඬු නාමය.

2. මේ පනතෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන 1979 අංක 48 දරන ත්‍රස්තවාදය වැළැක්වීමේ (තාවකාලික විධිවිධාන) පනතේ 15 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:— — 1979 අංක 48 දරන පනතෙහි 15 වන වගන්තිය සංශෝධනය කිරීම.

(1) ඒ වගන්තිය, ඒ වගන්තියේ (1) වන උපවගන්තිය ලෙස නැවත අංක කිරීමෙන්; සහ

(2) ඒ වගන්තියේ නැවත අංක කරන ලද (1) වන උපවගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් උපවගන්තිය එකතු කිරීමෙන්:—

"(2) මේ පනත යටතේ වූ යම් වරදක් හෝ 23 වන වගන්තියේ විධිවිධාන අදාළ වන යම් වරදක් හෝ වෙනුවෙන් යම් තැනැත්තකුට විරුද්ධව අධිචෝදනාව මහ ධිකරණය වෙත ලැබුණ විට, නඩු විභාගය අවසන් වන තුරු ඒ තැනැත්තා සිර භාරයේ තබන ලෙස අධිකරණය විසින් සෑම අවස්ථාවක දීම අඥා කරනු ලැබිය යුතු ය.".

3. 15 වන වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්තිය ප්‍රධාන ප්‍රඥප්තියෙහි ඇතුළත් කරනු ලබන අතර, එය ප්‍රධාන ප්‍රඥප්තියේ 15අ වගන්තිය ලෙස බලපැවැත්විය යුතු ය:— — ප්‍රධාන ප්‍රඥප්තියේ 15අ අලුත් වගන්තිය ඇතුළත් කිරීම.

"නඩු විභාගය අවසන් වන තුරු රඳවා තැබීමේ ස්ථානය.

15අ. (1) 15 වන වගන්තියේ (2) වන උප වගන්තියේ හෝ 19(අ) වගන්තියේ හෝ විධිවිධාන යටතේ යම් තැනැත්තකු සිර භාරයේ සිටින අවස්ථාවක, මේ පනතේ නැතහොත් වෙනත් යම් නීතියක විධිවිධානවල කුමක් සඳ හන්ව ඇත ද රාජ්‍ය ආරක්ෂක විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යංශයේ ලේකම්වරයා විසින් ජාතික ආරක්ෂාව හෝ මහජන සාමය කෙරෙහි සැලකිලිමත්ව, තීරණය කරනු ලබන ස්ථානයක සහ එසේ තීරණය කරනු ලබන කොන්දේසිවලට යටත්ව, ඒ තැනැත්තා යම් බලධරයකුගේ අත් අඩංගුවෙහි තබා ගැනීම ජාතික ආරක්ෂාව හෝ මහජන සාමය හෝ

2—ඒ 61773—14,400 (82/03)

උදෙසා අවශ්‍යයයි හෝ අවස්ථානුකූලයයි ඒ ලේකම්වරයා අදහස් කරනහොත්, ඒ තැනැත්තා සම්බන්ධයෙන් සාධාරණ නඩු විභාගයක් පැවැත් වෙන බවට වගබලා ගැනීම පිණිස මහාධිකරණය විසින් කරනු ලබන විධානවලට යටත්ව, ඒ තැනැත්තා එසේ අත් අඩංගුවේ තබා ගත යුතු බවට නියමයක් ඒ ලේකම්වරයා විසින් කරනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ කරනු ලබන යම් නියමයක් මහාධිකරණය වෙත සහ බන්ධනාගාර කොමසාරිස්වරයා වෙත දන්වනු ලැබිය යුතු අතර, ඒ නියමයෙහි දැක්වෙන බලධරයාගේ අත් අඩංගුවට ඒ තැනැත්තා පත් කිරීම ඒ කොමසාරිස්වරයාගේ කාර්යය විය යුතුය. තව ද ඒ තැනැත්තා අත් අඩංගුවට ගැනීම සම්බන්ධයෙන් බන්ධනාගාර ආඥාපනතේ විධිවිධාන අදාළ වීම අවසන් විය යුතු ය.".

*ප්‍රධාන ප්‍රඥප්තියේ 29 වන වගන්තිය ඉවත් කිරීම.*

4. ප්‍රධාන ප්‍රඥප්තියේ 29 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලැබේ.

*ප්‍රධාන ප්‍රඥප්තියේ 31 වන වගන්තිය සංශෝධනය කිරීම.*

5. ප්‍රධාන ප්‍රඥප්තියේ 31 වන වගන්තියෙහි "නීති විරෝධී ක්‍රියාකාරකම" යන්නෙහි අර්ථ කථනය වෙනුවට පහත දැක්වෙන අර්ථ කථනය ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

'"නීති විරෝධී ක්‍රියාකාරකම" යන්නෙන්, මේ පනත යටතේ යම් වරදක් සිදු කිරීමට හෝ සිදු කිරීම සම්බන්ධයෙන් හෝ ශ්‍රී ලංකාව තුළ දී හෝ ඉන් පිටත දී කවර වූ හෝ යම් ක්‍රමයකින් ගනු ලැබූ යම් ක්‍රියා මාර්ගයක් නැතහොත් කරනු ලැබූ යම් ක්‍රියාවක් වේ ද, ඒ ක්‍රියා මාර්ගය ගනු ලැබුවේ නැතහොත් ඒ ක්‍රියාව කරනු ලැබුවේ මේ පනතේ සියලු විධිවිධාන හෝ විධිවිධානවලින් කිසිවක් හෝ ක්‍රියාත්මක වීමේ දිනට පෙර හෝ පසුව හෝ වුව ද, ගනු ලැබූ ඒ ක්‍රියා මාර්ගය නැතහොත් කරනු ලැබූ ඒ ක්‍රියාව හෝ, මේ පනත සම්මත කිරීමේ දිනට පෙර කරනු ලැබූ යම් ක්‍රියාවක් ඒ දිනට පසුව කරනු ලැබුවේ නම්, මේ පනත යටතේ වරදක් වන්නේ ද ඒ ක්‍රියාව, අදහස් වේ.'.

*සංශෝධනය අතීතයට බලපෑම.*

6. (1) මේ පනතේ 5 වන වගන්තියෙන් ප්‍රධාන ප්‍රඥප්තියට කරන ලද සංශෝධනය 1979 ජූලි මස 24 වන දින සිට බලාත්මක වූ ලෙස සියලු කාර්ය සඳහා සලකනු ලැබිය යුතු ය.

(2) ප්‍රධාන ප්‍රඥප්තියේ විධිවිධාන යටතේ කරනු ලැබූ සෑම නියමයක් ම, මේ පනතින් සංශෝධිත ප්‍රධාන ප්‍රඥප්තියේ විධිවිධාන යටතේ කරන ලද නියමයක් ලෙස සියලු කාර්ය සඳහා සලකනු ලැබිය යුතු ය.

(3) ප්‍රධාන ප්‍රඥප්තියේ යම් විධිවිධානයක අර්ථනිරූපණය පිළිබඳ ප්‍රශ්නයක් යම් අධිකරණයක පවත්නා යම් නඩු කටයුත්තක දී හෝ කාරණයක දී උද්ගත වන අවස්ථාවක දී, ඒ ප්‍රශ්නය මේ පනතින් සංශෝධිත ප්‍රධාන ප්‍රඥප්තියේ විධිවිධානවලට අනුකූලව නිශ්චය කරනු ලැබිය යුතු ය.